සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2013

1330

## 8 - ශ්‍රේණිය

## නාට්‍ය හා රංග කලාව

නම/විභාග අංකය :- ........................................................................ කාලය : පැය 01 1/2යි.

## I කොටස

**✼ 1 සිට 5 දක්වා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. වලහා සහ මාෂා නාට්‍යයේ නිර්මාණකරුවා වන්නේ,
    1. පාලිත ලොකුපෝතාගම   2. ඩී. කුමාරගේ
    3. අමිතා රබ්බිඩිගල   4. චන්ද්‍රසේන දසනායක

02. "සවන් දී පෙර රාම චරිතේ අසව්" ගීතය කුමන තූර්තියක ගීයක් ද?
    1. සිරිසඟබෝ   2. රාමායනය   3. රොලීනා   4. දස්කොන්

03. රූකඩ වර්ගවලට අයත් නොවන්නේ,
    1. අත් රූකඩ   2. ඇඟිලි රූකඩ   3. බම්බු රූකඩ   4. නූල් රූකඩ

04. නාට්‍යමය ලක්ෂණ ඇතුළත් ආගමික කතා පුවතක් නො වන්නේ,
    1. අකීකරු පුත්‍රයා.   2. වෙස්සන්තර.
    3. යහපත් සමරිතානුවරයාගේ කතාව.   4. සිංහබාහු.

05. සාන්තුවර සෙබළාණෝ නාට්‍යය නිර්මාණය කළේ,
    1. සුගතපාල ද සිල්වා.   2. දයානන්ද ගුණවර්ධන.
    3. හෙන්රි ජයසේන.   4. එදිරිවීර සරච්චන්ද්‍ර.

**✼ A කොටසට ගැළපෙන පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.**

| A | B |
|---|---|
| 6. රංග විධාන | අධ්‍යක්ෂවරයා |
| 7. නළු වරණය | නළුවා |
| 8. භාව ප්‍රකාශනය | රචකයා |
| 9. ගුණ දොස් පළ කිරීම | ප්‍රේක්ෂකයා |
| 10. රස විඳීම | විචාරකයා |

**✼ 11 - 15 දක්වා ප්‍රශ්න සඳහා හරි නම් '✓' ලකුණ ද වැරදි නම් '✕' ලකුණ ද යොදන්න.**

11. "සෝබාවදේ මෙපුර සිරි විසිතුරු" හුණුවටයේ කතාව නාට්‍යයේ ගීතයකි. (   )
12. කටහඬ අභ්‍යාස සඳහා ශාන්තිකර්ම ගී යොදාගත නොහැක. (   )
13. මිනිසුන් තුළ ඇති වන විවිධ හැඟීම් ශබ්ද, ස්වර, වචන මඟින් ප්‍රකාශ කළ හැක. (   )
14. රංගනයේ දී මනස හා සම්බන්ධ නොවී ශාරීරික ක්‍රියාවන් කළ හැක. (   )
15. රංගන කාර්යයේ නියැළීමට පෙර ශරීරය උණුසුම් කිරීම අවශ්‍ය වේ. (   )

❊ **16-20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**

16. වේදිකා නාට්‍ය මගින් පණිවුඩ, අදහස්, අවවාද ආදිය .............................................. කරනු ලබයි.
17. අභිරූපණය ........................................................................ කින් යුතුව ඉදිරිපත් කළ යුතුය.
18. රංග ක්‍රීඩාවල යෙදෙන විට ...................................................... ඉතා වැදගත් වේ.
19. ශරීරය උණුසුම් කිරීමේ අභ්‍යාසවල නිරත වීමෙන් ශරීරයට ........................................................ ලැබේ.
20. නළු කාර්යයේ දී ........................................................... වැදගත් වේ.

(ස්මරණය, සන්නිවේදනය, ප්‍රබෝධය, සංගීතය, අතිශයෝක්තිය, අවධානය)

(ලකුණු 20 × 1 = 20)

## II කොටස

❊ **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.**

01. පහත දැක්වෙන නාට්‍ය නාට්‍ය ඛණ්ඩය ඇසුරින් පිළිතුරු සපයන්න.

කුජු....... කුජු....... කුජු ......///
පෙට්ටි ගොඩයි - පෙට්ටි ගොඩයි
වංගු ගොඩයි - වංගු ගොඩයි
අඟුරු කකා - වතුර බිබී
කොළඹ දුවන - යකඩ යකා
ඕන්න එනවෝ - ඕන්න එනවෝ

(i) මෙම නාට්‍යය සහ එහි නිර්මාණකරුවා නම් කරන්න. (ලකුණු 01)
(ii) 7 වන ශ්‍රේණියේ දී ඔබ උගත් කෝච්චියක් සම්බන්ධ වූ අනෙක් ළමා නාට්‍ය කුමක් ද? (ලකුණු 01)
(iii) රාජු බේරා ගැනීම සඳහා ළමුන් වෙස්වලා ගන්නා චරිත තුනක් නම් කරන්න. (ලකුණු 03)
(iv) මෙම නාට්‍යයෙන් ළමුනට ගත හැකි ආදර්ශ දෙකක් ලියන්න. (ලකුණු 02)
(v) ඔබ හෝ ඔබේ පාසලේ ශිෂ්‍යයන් මුහුණ දුන් මෙවැනි අර්බුදයක් විස්තර කරන්න. (ලකුණු 03)

02. (i) ඔබ උගත් නාට්‍ය ගීතයක් ලියන්න. (ලකුණු 05)
(ii) නාට්‍ය ගීතයකින් නාට්‍යයකට ඇති ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 05)

03. (i) සතර අභිනය නම් කරන්න. (ලකුණු 04)
(ii) ඉන් එක අභිනයක් විස්තර කරන්න. (ලකුණු 06)

04. (i) ඔබ පාසලේ දී කළ ශරීරය සැහැල්ලු කිරීමේ අභ්‍යාසයක් විස්තර කරන්න. (ලකුණු 03)
(ii) ඉන් ඔබට අත් වූ ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 07)

05. (i) ප්‍රේක්ෂකයා යනු කවරෙක් ද? (ලකුණු 04)
(ii) හොඳ ප්‍රේක්ෂකයෙකු සතු ගුණාංග දෙකක් ලියන්න. (ලකුණු 06)

06. ඔබ අත්විඳි අත්දැකීමක් ඇසුරින් කෙටි නාට්‍යයක් රචනා කරන්න. (ලකුණු 10)